SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2017 ජූලි

## ප්‍රශ්න සහ යෝජිත උත්තර
## (AA13)

## ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව
## (EBA)

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශය

## AA1 විභාගය - 2017 ජූලි
## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

## යෝජිත උත්තර

**A කොටස**

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**
**අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.**
**(මුළු ලකුණු 40)**

### 1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| ප්‍රශ්න අංකය | උත්තරය |
|---|---|
| 1.1 | 2 |
| 1.2 | 3 |
| 1.3 | 4 |
| 1.4 | 2 |
| 1.5 | 2 |
| 1.6 | 2 |
| 1.7 | 4 |
| 1.8 | 1 |
| 1.9 | 4 |
| 1.10 | 4 |
| 1.11 | අසත්‍යයි. |
| 1.12 | අසත්‍යයි. |
| 1.13 | සත්‍යයි. |
| 1.14 | අසත්‍යයි. |
| 1.15 | සත්‍යයි. |
| 1.16 | ශුන්‍ය |
| 1.17 | ධනාත්මකව |
| 1.18 | වාණිජ බැංකුවල |
| 1.19 | තිරසාර සංවර්ධනය |
| 1.20 | රැකියා වියුක්ත |

***(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)***

***A* කොටසෙහි අවසානය.**

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතරකි. (04)

(මුළු ලකුණු 40)

## 2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) ආර්ථික නොවන සම්පත් යනු, නිෂ්පාදන ක්‍රියාවලියේ දී ආවස්ථික පිරිවැයක් නොමැති භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී අසීමිත ප්‍රමාණවලින් ලබාගත හැකි සම්පත් වේ. උදා:- වැසි ජලය, හිරුඑළිය, ස්වභාවික වාතය

ආර්ථික නොවන සම්පත්වල පහත ලක්ෂණ දැකගත හැකිය.

- සැපයුම සීමාරහිත වීම (හිඟකමක් නොමැති වීම)
- ආවස්ථික පිරිවැයක් නොතිබීම
- වෙළෙඳපොළක් සහ මිලක් නොමැතිවීම

*(ලකුණු 03)*

(b) මිල ඉල්ලුම් නම්‍යතාව (PED) = $\frac{\text{භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණයේ ප්‍රතිශතක වෙනස}}{\text{භාණ්ඩයේ මිලෙහි ප්‍රතිශතක වෙනස}}$

$$PED = \frac{\%\triangle Qd}{\%\triangle P}$$

$$PED = \frac{\triangle Qd}{\triangle P} \times \frac{P}{Qd}$$

$$= \frac{5}{1} \times \frac{10}{20} \quad \text{හෝ}$$

$$= \frac{25\%}{10\%}$$

*(ලකුණු 03)*

$$= \underline{\underline{2.5}}$$

(c)

| | පූර්ණ තරගය | ඒකාධිකාරය |
|---|---|---|
| 1 | වෙළෙඳපොළේ සැපයුම්කරුවන් ඉතා විශාල සංඛ්‍යාවක් ඇත. | වෙළෙඳපොළේ එක් සැපයුම්කරුවෙක් පමණක් සිටී. |
| 2 | සමජාතීය භාණ්ඩ වේ. | විශේෂිත භාණ්ඩ වේ. (කිට්ටු ආදේශන නොමැත) |
| 3 | වෙළෙඳපොළට පිවිසීමට සහ පිටවීමට බාධක නොමැත. | පිවිසීමට සහ පිටවීමට බාධක ඇත. |
| 4 | දිගුකාලීන සමතුලිතයේ දී ව්‍යාපාර විසින් සාමාන්‍ය ලාභ ලබයි. | දිගුකාලීන මෙන්ම කෙටිකාලීන සමතුලිතයේදීත් ආර්ථික ලාභ ලබයි. |
| 5 | එක් වෙළෙඳ මිලක් පවතී. එබැවින් මිල ලබාගන්නෙකු වේ. | ආයතනය විසින්ම භාණ්ඩයේ මිල තීරණය කරනු ලබයි. එබැවින් මිල තනන්නෙකු වේ. |
| 6 | ආයතනයේ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය ස්වරූපයක් ගනී. | ආයතනයේ ඉල්ලුම් වක්‍රය පහතට බෑවුම් වන ස්වරූපයක් ගනී. |

*(ලකුණු 04)*

*(මුළු ලකුණු 10)*

## 3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a)

i. ඉහත ප්‍රකාශය සමග එකඟ වේ.

**(ලකුණු 01)**

ii. නිෂ්පාදන සාධක සඳහා ඇති ඉල්ලුම රඳා පවතින්නේ නිෂ්පාදන සාධක සමග නිෂ්පාදනය කරන භාණ්ඩවල ඉල්ලුම මතය.

නිෂ්පාදන සාධකවල ඉල්ලුම තීරණය කරනු ලබන්නේ නිෂ්පාදකයන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩවල ඉල්ලුම මතය.

නිෂ්පාදන සාධකවල අයිතිය කුටුම්භ සතුව පවතින අතර ඔවුන් ඔවුනට ලැබෙන සැපයුම මත මිල තීරණය කරයි. මිල තීරණය වන්නේ ඉල්ලුම මත සහ නිෂ්පාදන සාධකවල සැපයුම මතය.

**(ලකුණු 03)**

(b)

**1. වැඩෙන පරිමාණානුකූල ඵල**

යෙදවුම් සමානුපාතිකව වැඩි කරන විට නිමැවුම ඊට වැඩි වේගයකින් ඉහළ යයි නම් ඊට වැඩෙන පරිමාණානුකූල ඵල යැයි කියනු ලැබේ. ශ්‍රමය සහ ප්‍රාග්ධනය 100% කින් වැඩි කරන විට නිමැවුම 100% ට වඩා වැඩි වේගයකින් ඉහළ යයි.

**2. හීනවන පරිමාණානුකූල ඵල**

යෙදවුම් සමානුපාතික ලෙස වැඩි කරන විට නිමැවුම ඊට අඩු වේගයකින් ඉහළ යාම වේ.

**3. ස්ථාවර පරිමාණානුකූල ඵල**

යෙදවුම් සමානුපාතික ලෙස වැඩි කරන විට නිමැවුම ද ඒ ප්‍රමාණයෙන් ඉහළ යයි නම් ඊට ස්ථාවර පරිමාණානුකූල ඵල යැයි කියනු ලැබේ.

**(ලකුණු 06)**

**(මුළු ලකුණු 10)**

## 4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a)

(i) 1. පොදු පිළිගැනීම
2. පහසුවෙන් ගෙන යා හැකි වීම
3. කල්පැවැත්ම
4. විභජනය කළ හැකි වීම
5. සමජාතීය බව
6. දතහැකි බව
7. ස්ථාවර බව
8. හඳුනාගත හැකි බව
9. නම්‍යශීලී බව
10. ප්‍රමිතිකරණය කළ හැකි බව
11. හික්මවිය හැකි බව

***(ලකුණු 04)***

(ii) 'මුදලට ඇති ඉල්ලුම' යනු මූල්‍ය වත්කමක් ලෙස මුදල්මය ආකාරයෙන් ළඟ තබාගෙන සිටීමේ අපේක්ෂාවයි. මුදලට ඇති ඉල්ලුම සඳහා විවිධ අංශ බලපානු ලබයි. ඒවා නම්, ආදායම් මට්ටම, පොලී ප්‍රතිශතය, උද්ධමනය සහ අනාගත අනපේක්ෂිතභාවය වේ. මුදලට ඇති ඉල්ලුම චේතනා 3 ක් හරහා විස්තර කෙරේ. ඒවානම්,

- ගනුදෙනු කිරීමේ චේතනාව
- ආරක්ෂණ චේතනාව
- සමපේ්‍රක්ෂණ චේතනාව

***(ලකුණු 03)***

(b) ප්‍රධාන කාර්යයන්

- ආර්ථික සහ මිල ස්ථායිතාවය
- මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය

ප්‍රධාන කාර්යයන්ට අනුයාත කාර්යයන්

- මුදල් නිකුත් කිරීම හා කළමනාකරණය කිරීම

නියෝජිත කාර්යයන්

- සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය කිරීම
- විදේශ විනිමය කළමනාකරණය කිරීම
- රාජ්‍ය ණය කළමනාකරණය කිරීම
- ප්‍රාදේශීය සංවර්ධන කටයුතු කළමනාකරණය කිරීම

වාණිජ බැංකු සමග සම්බන්ධතාවය සහ වාණිජ බැංකු පාලනය (බැංකුවල බැංකුව)


- වාණිජ බැංකු සමග සම්බන්ධතාවන් පවත්වාගෙන යාම

***(ලකුණු 03)***

***(මුළු ලකුණු 10)***

## 5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) උපරිම මිල ප්‍රතිපත්තිය පහත අයුරින් විස්තර කළ හැකිය.




උපරිම මිල ප්‍රතිපත්තිය නිසා විය හැකි ප්‍රතිවිපාක

- ඉල්ලුම් ප්‍රමාණයන් ඉහළ යාම සහ සැපයුම් ප්‍රමාණයන් පහළ යාම. එමනිසා වෙළෙඳපොළ තුළ අතිරික්ත ඉල්ලුමක් හටගැනීම.
- වෙළෙඳපොළේ පවතින භාණ්ඩවල හිඟය නිසා කළුකඩ සහ කළුකඩ මිල හටගැනීම
- භාණ්ඩවල හිඟ ඇතිවිය හැකිවීම සහ භාණ්ඩ මිලදී ගැනීමේ දිගු පෝලිම් දැකගත හැකි වීම.
- සලාක ක්‍රම සහ මූල්‍යමය උපකාර කිරීමේ වැඩසටහන් රජය මගින් හඳුන්වා දීම.
- අතිරික්ත ඉල්ලුම ආනයනය කිරීම.
- සැපයුම වැඩි කිරීම සඳහා ආයතන උනන්දු කරවීම.
- අඩු ගුණත්වයකින් යුතු නිෂ්පාදිත වෙළෙඳපොළට හඳුන්වාදීම.
- අහිතකර ප්‍රතිඵල මැඩපැවැත්වීම සඳහා රජයේ මැදිහත්වීම.

**(ලකුණු 06)**

( b) **ආරක්ෂණ ක්‍රියාමාර්ගවල වාසි**

- විදේශ රටවලින් ඇති කරන අමතර තරගකාරීත්වයෙන් දේශිය නිෂ්පාදකයන් ආරක්ෂා වීම.
- වර්ධනය වීමට පෙර ඇතිවිය හැකි තරගකාරීත්වයෙන් ළදරු කර්මාන්ත ආරක්ෂා වීම.
- ආර්ථිකය තුල රැකියා අවස්ථා ආරක්ෂා කිරීමට සහය වීම.
- භාවිතයට නුසුදුසු ඉතා ලාභදායි ලෙස සපයන ආනයන වැළැක්වීමට හේතුවීම.
- හානිදායක සහ අහිතකර භාණ්ඩ රටතුලට ඒම වැළැක්වීම.
- ආනයන සීමා කිරීම තුලින් ගෙවුම් ශේෂ දුෂ්කරතා මගහරවා ගැනීමට සහය වීම.

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

***B* කොටසෙහි අවසානය.**

## C කොටස

අනිවාර්ය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 20)

## 6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

A.

(a) ප්‍රධාන ආර්ථික ක්‍රම වර්ග 03 වන්නේ;

- ධනවාදී ආර්ථික ක්‍රමය (වෙළෙඳපොළ ආර්ථික පද්ධතිය)
- සමාජවාදී ආර්ථික ක්‍රමය (විධාන ආර්ථික පද්ධතිය / සැලසුම්ගත ආර්ථික පද්ධතිය)
- මිශ්‍ර ආර්ථික ක්‍රමය

(b) **(1)** **ධනවාදී ආර්ථික ක්‍රමය**

මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා මිල යාන්ත්‍රණය යොදාගනු ලබයි. වෙළෙඳපොළ ආර්ථිකයේ අභිප්‍රේරණ සාධකය 'ලාභ චේතනාව' වේ.

<u>කුමක්, කොපමණ ප්‍රමාණයෙන් නිපදවිය යුතුද යන්න</u>:

වෙළෙඳපොළ ආර්ථිකයක, භාණ්ඩවල සාපේක්ෂ මිල සහ ඒවායේ ලාභදායිත්වය මත මෙය තීරණය වේ. මෙහිදී භාණ්ඩවල මිල ගණන් අතර සැසඳීමක් කරනු ලබන අතර නිෂ්පාදකයන් විසින් විශාල ලාභ සහ ඉහළ මිල ගණන් පවතින භාණ්ඩ නිපදවීම සඳහා විශාල සම්පත් ප්‍රමාණයක් වෙන් කරනු ලබයි.

<u>කෙසේ නිෂ්පාදනය කරන්නේ ද යන්න</u>:

සාධක මිල මත රඳෙමින්, අවම පිරිවැයන් යටතේ, වැඩිම ලාභදායිත්වයක් ලැබෙන භාණ්ඩ හා සේවා නිපදවනු ලැබේ.

<u>කා සඳහා නිපදවන්නේ ද යන්න</u>:

එම මිල ගෙවීමේ හැකියාවක් ඇති අය සඳහා නිපදවනු ලබයි. මෙය මිලදී ගැනීමේ හැකියාව මත තීරණය වේ.

**(2)** **සමාජවාදී / සැලසුම්ගත / විධාන ආර්ථිකය**

<u>කුමක්, කොපමණ නිපදවිය යුතුද යන්න</u>:

මධ්‍යම සැලසුම් අධිකාරිය විසින් තීරණය කරනු ලබයි. සියලුම සම්පත්වල හිමිකාරිත්වය රජය සතුවන අතර කොපමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කළ යුතුද යන්න රජය විසින් තීරණය කරයි. සමාජයේ අවශ්‍යතාවය අනුව භාණ්ඩ හා සේවා නිපදවීම සිදු කරයි. මිල පිළිබඳව විශේෂ අවධානයක් යොමු නොකරනු ලැබේ. සමාජයට අත්‍යවශ්‍ය භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා සම්පත් වෙන් කිරීමක් කරනු ලබයි.

<u>කෙසේ නිෂ්පාදනය කරන්නේ ද</u>:

මධ්‍යම අධිකාරිය විසින් සැලසුම් ආර්ථිකයක් සංවිධානය කරයි. නිෂ්පාදනය සිදු කරනු ලබන්නේ රාජ්‍ය ආයතන මගිනි. මධ්‍යම අධිකාරිය මගින් ලබාදෙන විධානවලට අනුව තාක්ෂණික උපක්‍රම තීරණය කරනු ලැබේ.

කා සඳහා නිපදවන්නේ ද යන්න:

මධ්‍යම සැලසුම් අධිකාරිය මගින් සමාජයේ අවශ්‍යතාවය සහ මහජනයාගේ සුබසිද්ධිය උපරිම කිරීමේ අරමුණ ඇතිව ගනු ලබන තීරණ මගින් මෙම ප්‍රශ්නය විසඳනු ලැබේ. මිල පිළිබඳ තීරණය කරනු ලබන්නේ මධ්‍යම අධිකාරිය මගිනි.

(3) **මිශ්‍ර ආර්ථිකය**

නිදහස් සහ සැලසුම්ගත යන ආර්ථිකයන් දෙකෙහිම ලක්ෂණ මෙහි දැකිය හැකිය. මෙහිදී මිල යාන්ත්‍රණය සහ සැලසුම්ගත පද්ධති යන දෙකම ක්‍රියාත්මක වේ.

කුමක්, කොපමණ නිපදවිය යුතුද යන්න:

විශාල මිලක් සහ විශාල ලාභයක් ලැබෙන භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා පෞද්ගලික ආයතන නැඹුරු වේ. රාජ්‍ය අංශය මගින් සමාජ සුබසාධනය උපරිම කරන භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා උනන්දු වේ. රජය විසින් සහනාධාර සහ බදු හරහා භාණ්ඩ මිලට බලපෑම් ඇති කරනු ලබන අතර ඍජුව සහ වක්‍රව මිල යාන්ත්‍රණයේ මෙහෙයුම්වලට ද බලපෑම් ඇති කරයි.

කෙසේ නිෂ්පාදනය කරන්නේ ද යන්න:

පෞද්ගලික අංශ මගින් අවම පිරිවැය ක්‍රම සහ උපරිම ලාභ ලැබෙන ක්‍රම නිෂ්පාදනය සඳහා යොදාගනී. සමාජ සාධාරණය උපරිම වන ලෙස රජයේ නිෂ්පාදන තාක්ෂණය යොදාගනී.

කා සඳහා නිපදවන්නේ ද යන්න:

මහජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව මත මෙය තීරණය කරනු ලබන අතර මෙයට රාජ්‍ය බලපෑම ද එල්ල වේ. මිලදී ගැනීමේ හැකියාව තීරණය වන්නේ මානව සහ ද්‍රව්‍යමය සම්පත්වල හිමිකාරිත්වය මතය. රජයේ මැදිහත් වීම් මහජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව සඳහා සංඥා නිකුත් කරයි.

උදා :- ආදායම සහ ධනය මත ක්‍රමයෙන් වැඩි වන සේ බදු පැනවීම, පහළ ආදායම් ලබන කොටස් සඳහා සහනාධාර දීම, සමාජ ආරක්ෂණ වැඩසටහන් හඳුන්වා දීම.

***(ලකුණු 06)***

B

(a)

| | රු. (මිලියන) |
|---|---|
| කෘෂිකර්මය, පශු සම්පත් සහ වන නිෂ්පාදන | 250 |
| ධීවර | 120 |
| පතල් සහ කැණීම් කටයුතු | 75 |
| නිමැවුම් කර්මාන්ත | 100 |
| විදුලිය, ගෑස් සහ ජලය | 200 |
| ඉදිකිරීම් | 80 |
| තොග සහ සිල්ලර වෙළෙඳාම | 150 |
| හෝටල් සහ අවන්හල් | 100 |
| ප්‍රවාහනය සහ සන්නිවේදනය | 160 |
| බැංකු, රක්ෂණ හා දේපළ වෙළෙඳාම් | 135 |
| නිවාස හිමිකම් | 200 |
| රාජ්‍ය සේවා | 160 |
| පෞද්ගලික සේවා | 250 |
| **2016 වර්ෂයට සාධක පිරිවැය මිලට දළ දේශීය නිෂ්පාදිතය** | **1,980** |

***(ලකුණු 05)***

(b)

| අයිතමය | රු. (මිලියන) |
|---|---|
| **සාධක පිරිවැය මිලට දළ දේශීය නිෂ්පාදිතය** | **1,980** |
| **එකතු කිරීම්:** වක්‍ර බදු | 150 |
| **අඩු කිරීම්:** සහනාධාර | (100) |
| **2016 වසර සඳහා වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය** | **2,030** |

***(ලකුණු 03)***

(c) **2016 වසර සඳහා මූර්ත දළ දේශීය නිෂ්පාදිතය**

| | | (රු. මිලියන) |
|---|---|---|
| 2016 වසරේ දළ දේශීය නිෂ්පාදිතය (වෙළෙඳපොළට මිලට) | = | 2030 |
| 2016 වසරේ මිල දර්ශකය | = | 125 |
| 2016 වසරේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය | = | 2030/125*100 |
| (වෙළෙඳපොළ මිලට) | = | **1,624** |

***(ලකුණු 03)***

***(මුළු ලකුණු 20)***

***C* කොටසෙහි අවසානය.**

***Notice :***

These answers complied and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers".
The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2017 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*
*All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*